# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,823 - 2013 අගෝස්තු මස 08 වැනි බ්‍රහස්පතින්දා - 2013.08.08**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : I වැනි ඡේදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 718 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |

| | පිටුව |
|---|---|
| රජයේ නිවේදන ... ... ... | 720 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | 721 |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 727 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් *භාරගැනීම ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2013 අගෝස්තු මස 30 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2013 අගෝස්තු මස 16 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය.''*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.
*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2013 අංක 265

MOD/DEF/02/01/ARF/RET/292.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක් සහ විශ්‍රාම ගැනීමක්

**නිල ස්ථිර කිරීමක්**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරි 2013 ජනවාරි මස 09 වැනි දින සිට ලුතිතන් කර්නල් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

තාවකාලික ලුතිතන් කර්නල් ගමගේ නලින් චමින්ද පීරිස් ශ්‍රීලවියාඉ (නි/61770)

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරි 2013 ජනවාරි මස 10 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

ලුතිතන් කර්නල් ගමගේ නලින් චමින්ද පීරිස් ශ්‍රීලවියාඉ (නි/61770)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2012 දෙසැම්බර් මස 12 වැනි දින,
කොළඹ දී ය.

08-362

---

2013 අංක 266

MOD/DEF/2/01/ARF/RET/280.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක් සහ විශ්‍රාම ගැනීමක්

**නිල ස්ථිර කිරීමක්**

පහත නම සඳහන් නිලධාරි 2012 ඔක්තෝබර් මස 25 වැනි දින සිට මේජර් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

තාවකාලික මේජර් නිරෝෂන් ඇන්තනි සබුබ (නි/64943)

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරි 2012 ඔක්තෝබර් මස 26 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් නිරෝෂන් ඇන්තනි සබුබ (නි/64943)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2012 නොවැම්බර් මස 25 වැනි දින,
කොළඹදී ය.

08-357

---

2013 අංක 267

MOD/DEF/02/01/ARF/RET/293.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක් සහ විශ්‍රාම ගැනීමක්

**නිල ස්ථිර කිරීමක්**

පහත නම සඳහන් නිලධාරි 2013 අප්‍රේල් මස 15 වැනි දින සිට තාවකාලික මේජර් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

තාවකාලික මේජර් නිශ්ශංක ආරච්චි අප්පුහාමිලාගේ මංජුල ප්‍රදීප් නිශ්ශංක ශ්‍රීලයුයුබ (නි/63231)

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරි 2013 අප්‍රේල් මස 16 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් නිශ්ශංක ආරච්චි අප්පුහාමිලාගේ මංජුල ප්‍රදීප් නිශ්ශංක ශ්‍රීලයුයුබ (නි/63231)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2012 දෙසැම්බර් මස 12 වැනි දින,
කොළඹ දී ය.

08-363

2013 අංක 268

MOD/DEF/2/01/ARF/RET/290.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක් සහ විශ්‍රාම ගැනීමක්

**නිල ස්ථිර කිරීමක්**

පහත නම සඳහන් නිලධාරි 2013 මැයි මස 13 වැනි දින සිට මේජර් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

තාවකාලික මේජර් සෙන්දනායකලාගේ ලලිත් නන්දසේන ශ්‍රීලපාහ (නි/63639)

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරි 2013 මැයි මස 14 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් සෙන්දනායකලාගේ ලලිත් නන්දසේන ශ්‍රීලපාහ (නි/63639)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2012 නොවැම්බර් මස 25 වැනි දින,
කොළඹ දී ය.

08-361

---

2013 අංක 269

MOD/DEF/2/01/ARF/REM/343.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරි 2012 නොවැම්බර් මස 16 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

ලුතිතන් දිසානායක මුදියන්සේලාගේ ප්‍රියන්ත චන්ද්‍රසිරි ගැහේබ (නි/66704)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2013 පෙබරවාරි මස 19 වැනි දින,
කොළඹ දී ය.

08-356

2013 අංක 270

MOD/DEF/07/01/AVF/RET/283.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බලසේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක් සහ විශ්‍රාම ගැනීමක්

**නිල ස්ථිර කිරීමක්**

පහත නම සඳහන් නිලධාරි 2012 දෙසැම්බර් මස 18 වැනි දින සිට බ්‍රිගේඩියර් නිලයේ නිල ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

තාවකාලික බ්‍රිගේඩියර් ගැමුණු කුමාර බණ්ඩාර දිසානායක (නි/2401)

**විශ්‍රාම ගැන්වීමක්**

පහත නම සඳහන් නිලධාරි 2012 දෙසැම්බර් මස 19 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවෙන් විශ්‍රාම ගැන්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

බ්‍රිගේඩියර් ගැමුණු කුමාර බණ්ඩාර දිසානායක (නි/2401)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2012 දෙසැම්බර් මස 12 වැනි දින,
කොළඹ දී ය.

08-360

---

2013 අංක 271

MOD/DEF/07/01/AVF/RET/278.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බලසේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක් සහ විශ්‍රාම ගැනීමක්

**නිල ස්ථිර කිරීම**

පහත නම සඳහන් නිලධාරිණිය 2013 ජනවාරි මස 19 වැනි දින සිට මේජර් නිලයේ නිල ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

තාවකාලික මේජර් ලොකු කංකානම්ගේ දෝන ලීල චාන්දනී මුදලිගේ ශ්‍රීලයුකාබ (නි/5207)

**විශ්‍රාම ගැන්වීම**

පහත නම සඳහන් නිලධාරිණිය 2013 ජනවාරි මස 20 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවෙන් විශ්‍රාම ගැන්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් ලොකු කංකානම්ගේ දෝන ලීල වාන්දනී මුදලිගේ ශ්‍රීලයුකාබ (නි/5207)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2012 ඔක්තෝබර් මස 25 වැනි දින,
කොළඹ දී ය.

08-359

2013 අංක 272

MOD/DEF/07/01/AVF/RET/325.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බලසේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැන්වීම**

පහත නම සඳහන් නිලධාරි 2013 පෙබරවාරි මස 15 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවෙන් විශ්‍රාම ගැන්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් එඩ්මන්ඩ් අසෝක අලස් ගැහේබ (නි/2954)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2013 අප්‍රේල් මස 09 වැනි දින,
කොළඹදී ය.

08-358

# රජයේ නිවේදන

**2013 බොල්තුඹේ සමන් දේවාලයේ ඇසළ පෙරහැර**

2013 වසරේ ඇසළ පෙරහැර සඳහා කප් සිටුවීම ජූලි මස 09 වැනි දින අළුයම සුභ මොහොතින් සිදු කරන ලදී.

* අගෝස්තු මස 07 වැනි දින සිට 16 වැනි දින දක්වා උඩ මළුවේ පෙරහැර ද,
* අගෝස්තු මස 17 වැනි දින සිට අගෝස්තු මස 21 වැනි දින දක්වා මහ පෙරහැර ද,
* අගෝස්තු මස 22 වැනි දින වලහුන් ඇල්ල මූකලාන දිය උල්පතේ දී දිය කැපීමේ මංගල්‍යයෙන් අනතුරුව පෙරහැර ගෙවදීමෙන් ඇසළ පෙරහැර මංගල්‍ය නිමා කිරීමට නියමිතය.

(ii) දේවාලයේ උතුරට ඃ පාර, එම්. කේ. ලුවිස් සිංඤෝ, එම්. කේ. පොඩිමහත්තයා යන අයගේ ඉඩම ද, නැගෙනහිරට ඃ සිරිනිමල් හා එම්. කේ. විජේදාස යන අයගේ ඉඩම ද, දකුණට ඃ රංබණ්ඩාර මහතාගේ ඉඩම ද ගල්පඩිය වත්ත යන ඉඩම ද, බස්නාහිරට ඃ බී. එම්. විජේහාමි හා නෝබට් චින්තාමනී යන අයගේ ඉඩම ද මායිම්ව පිහිටි භූමි භාගය වන්දනාකරුවන්ට ලැගුම් සඳහා පෙරහැර නැරඹීම සඳහා වෙන් කරමි.

(iii) විහාර මළුව, බෝධි මළුව, හා දේවාල භූමිය, යන ස්ථාන අවට භූමි භාගවල ආහාර පිසීම තහනම් කරමි.

(iv) උඩ මළුව තුළ, දඩු හැල තුළ, චෛත්‍ය මළුව තුළ, හා විහාර මළුව තුළ සියලු වෙළඳාම් තහනම් කරමි.

(v) පහළ වීදියේ දකුණු පැත්තට ප්‍රධාන ගල් පඩිපෙළ සිට සිංහාසන මංදිරය දක්වා ද ගල් පඩිපෙළ නැගෙනහිර පැත්තෙන් නැටුම් කාමරය දක්වා ද පහළ වීදියේ දේවාලය දෙසට වන්නට රටගෙයි මළුව බැම්ම සිට චෛත්‍ය කොටස දක්වා ද මා විසින් නියම කරන ලද භූමිය ද නැවත රටගෙයි මළුවට නැගෙනහිරින් හා දකුණින් පහළ කොටස ද රටගෙයි ඉදිරිපසින් දේවාලයට නැගෙනහිර සීමාවට ආසන්නව වෙළඳාම් සඳහා පෙරහැර ගමන් කිරීමට අවහිර නොවන පරිදි අවසර දෙමි.

(vi) ඉහත (iv, v) වලින් නියම කර ඇති පරිදි හැර කඳවුරු භූමිය ඇතුළත අන් කිසිම ස්ථානයක වෙළඳාම් කිරීම සම්පූර්ණයෙන්ම තහනම් කරමි.

(vii) ප්‍රධාන මාර්ගයේ පුද්ගලික වාහන නතර කිරීම තහනම් කරමි. බයිසිකල් හා කරත්ත ඇතුළුව සියලුම රථ වාහන මාර්ග හෝ කඳවුරු භාර නිලධාරි තැනගේ බල පත්‍රයක් නොමැතිව කඳවුරු භූමිය තුළට ඇතුළත් කිරීම තහනම්ය.

(viii) මා විසින් කඳවුරු භූමිය තුළ වෙළඳාම් කිරීම සඳහා වෙන් කරනු ලබන බිම් කොටස් බදු දෙන ආකාරය දැන්වීම් මගින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

(ix) බද්දට ගන්නා ලද වෙළඳබිම්වල ඉදිකරනු ලබන තාවකාලික ගොඩනැගිලි සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ උපදෙස්වලට අනුකූල විය යුතු ය. බිම් කොටස් බදු ගන්නා වෙළෙන්දන් විසින් ඇසළ උත්සවයෙන් පසු තම තමන්ගේ තාවකාලික ගොඩනැගිලි ඉවත් කර ගැනීමෙන් පසු කඳවුරු භූමිය තුළ පොලිතීන් ඇතුළු සියලු අප ද්‍රව්‍ය එකතු කර මහජන සෞඛ්‍ය පරීක්ෂක මහත්වරුන්ගේ උපදෙස් පරිදි ඉවත් කළ යුතු ය.

(x) මාගෙන් ලබා ගත් අවසරයක් නොමැතිව කඳවුරු ප්‍රදේශයේ කිසිදු ගොඩනැගිල්ලක් ඉදිකිරීම තහනම්ය.

(xi) රතිඤ්ඤා වෙඩි ආදිය ප්‍රදේශය තුළ පත්තු කිරීම තහනම්ය.

(xii) ප්‍රාදේශීය ලේකම්ගේ බලය ලත් නිලධාරීන්ගේ අනුමැතිය නොමැතිව කිසියම් තැනැත්තෙකු විසින් කඳවුරු ප්‍රදේශය තුළ ටිකට්පත් කොඩි විකිණීම හෝ වෙනත් අන්දමක කුමන කාර්යක් සඳහා හෝ මුදල් එකතු කිරීම නොකළ යුතු ය.

ජේ. එල්. සී. කේ. ජයසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
ඉඹුල්පේ.

08-292

# ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා

**කොළඹ විශ්ව විද්‍යාලය**

කොළඹ විශ්ව විද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය

**2011 දෙසැම්බර් 31 වන දිනට ඒකාබද්ධ ශේෂ පත්‍රය**

| *වත්කම්* | *2011* *රු.* *N. B. V.* | *2010* *රු.* *N. B. V.* |
|---|---|---|
| *ජංගම නොවන වත්කම්* | | |
| *දේපල, පිරියත සහ උපකරණ :* | | |
| ගොඩනැගිලි | 13,609,495 | 14,575,191 |
| විද්‍යාගාර හා ඉගැන්වීම් උපකරණ හා ගෘහ භාණ්ඩ සහ සවි කිරීම් | 63,508,994 | 65,844,162 |
| පුස්තකාල පොත් සහ වාර සඟරා | 882,382 | 841,155 |
| මෝටර් රථ | 5,015,623 | - |
| එකතුව | 83,016,494 | 81,260,508 |
| පුනරුත්ථාපන හා ප්‍රාග්ධන වැඩි දියුණු කිරීම් | 31,309,842 | 34,381,973 |
| නොනිමි ඉදිකිරීම් වැඩ | 15,420,756 | |
| *ජංගම වත්කම් :* | | |
| තොග | 2,588,631 | 3,251,260 |
| ලැබීම් හා පෙර ගෙවීම් | 33,202,229 | 35,580,959 |
| SIDA අරමුදල් | 60,429,110 | 222,763,074 |
| LEARN අරමුදල් | - | 51,256,779 |
| මුදල් සහ මුදල් හා සමානදෑ | 482,533,173 | 401,219,612 |
| මුළු ජංගම වත්කම් | 578,753,143 | 714,071,684 |
| මුළු වත්කම් | 708,500,240 | 829,714,167 |
| *හිමිකම් හා වගකීම් :* | | |
| *ප්‍රාග්ධනය හා සංචිත ප්‍රාග්ධනය* | | |
| වැය නොකළ ප්‍රාග්ධන ප්‍රදාන | 3,361,251 | 6,976,033 |
| වැය නොකළ තොරතුරු තාක්ෂණ ප්‍රදාන | 895,466 | 895,466 |
| වැය කළ ප්‍රාග්ධන ප්‍රදාන | 39,984,898 | 34,638,590 |
| වැය කළ තොරතුරු තාක්ෂණ දීමනා | 7,785,509 | 11,218,659 |
| E Learning ව්‍යාපෘතිය - ප්‍රදාන | - | (330,992) |
| E Learning ව්‍යාපෘතිය - වැයකළ | - | 28,434,793 |
| IDRC ව්‍යාපෘතිය - ප්‍රදාන | 1,076,325 | 1,076,325 |
| IDRC ව්‍යාපෘතිය - වැයකළ | 648,785 | 648,785 |
| විදේශ අරමුදල් සැපයූ ව්‍යාපෘති - වැය නොකළ | 5,851,551 | 10,213,648 |
| විදේශ අරමුදල් සැපයූ ව්‍යාපෘති - වැය කළ | 3,250,000 | 3,368,988 |
| විලම්බිත ප්‍රදාන | 37,430,874 | - |
| කොළඹ විශ්ව විද්‍යාලයීය දායකත්වය | 8,155,714 | 8,155,714 |
| එකතුව | 108,440,373 | 105,296,009 |
| සංචිත | 342,298,905 | 272,126,842 |
| සීමා කළ අරමුදල් | 54,954,738 | 43,215,316 |
| *ජංගම නොවන වගකීම් :* | | |
| විශ්‍රාම ප්‍රතිලාභ | 23,393,238 | 20,233,733 |
| *ජංගම වගකීම් :* | | |
| වෙනත් ලැබිය යුතු සහ ගෙවිය යුතු දේ | 117,960,098 | 112,930,480 |
| SIDA අරමුදල් | 60,429,110 | 222,763,074 |
| LEARN අරමුදල්- | | 51,256,779 |
| බැංකු අයිරාව | 1,023,778 | 1,891,933 |
| එකතුව | 179,412,986 | 388,842,266 |
| මුළු හිමිකම් සහ වගකීම් | 708,500,240 | 829,714,167 |

2012 පෙබරවාරි මස 28 වැනි දින.

අධ්‍යක්ෂ (UCSC)

ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී.

**2011 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ ආදායම් හා වියදම් ගිණුම**

| | *2011* | *2010* |
|---|---|---|
| | *රු.* | *රු.* |
| *උපාධි අපේක්ෂක වැඩසටහන* | | |
| *ආදායම :* | | |
| රජයේ ප්‍රදාන | 83,102,728 | 65,381,575 |
| විලම්බිත ආදායම් - ප්‍රදාන | 19,778,039 | 13,011,762 |
| වෙනත් | 4,879,143 | 3,381,045 |
| | 107,759,910 | 81,774,382 |
| *උපාධි අපේක්ෂක වැඩසටහන - වියදම :* | | |
| පුද්ගල වේතන | 50,717,167 | 42,753,294 |
| ගමනාගමන වියදම් | 387,447 | 221,935 |
| සැපයුම් | 2,424,562 | 2,361,498 |
| කොන්ත්‍රාත්තුමය සේවාවන් | 24,159,062 | 19,250,982 |
| විශ්‍රාම ප්‍රතිලාභ | 8,133,475 | 7,543,504 |
| ග්‍රාහක, දායකත්ව සහ සාමාජික ගාස්තු | 44,139 | 73,471 |
| කාර්ය මණ්ඩල සංවර්ධනය | 349,643 | 196,875 |
| වෙනත් පුනරාවර්තන වියදම් | 6,094,293 | 7,718,630 |
| ක්ෂය | 18,551,317 | 13,011,763 |
| එකතුව | 110,861,105 | 93,131,952 |
| උපාධි අපේක්ෂක වැඩසටහන් වලින් හිඟය | (3,101,195) | (11,357,570) |
| *ව්‍යාප්ති වැඩසටහන් :* | | |
| විද්‍යාපති වැඩසටහන | 30,760,124 | 18,508,949 |
| බාහිර උපාධි මධ්‍යස්ථානය | 43,468,371 | 28,800,148 |
| පරිගණකකරණ සේවා මධ්‍යස්ථානය | 654,128 | 783,607 |
| උස්ස අංකිත මාධ්‍ය තාක්ෂණ මධ්‍යස්ථානය | 175,248 | 680,697 |
| ඉ ඉගෙනුම් මධ්‍යස්ථානය | 1,972,517 | - |
| වෘත්තීය සංවර්ධන මධ්‍යස්ථානය | (461,413) | (397,450) |
| ව්‍යාප්ති වැඩ සටහන් වලින් අතිරික්තය | 76,568,975 | 48,375,951 |
| *ව්‍යාපෘති :* | | |
| ඉ ඉගෙනුම් මධ්‍යස්ථානය | - | 3,905,611 |
| විදේශ අරමුදල් සැපයූ පොදු ව්‍යාපෘති | - | 568,418 |
| NeLC | - | 47,595 |
| IDRC අතථ්‍ය ගම්මානය | 65,944 | (28,602) |
| ව්‍යාපෘති වලින් අතිරික්තය | 65,944 | 4,493,022 |
| ශුද්ධ අතිරික්තය/(හිඟය) | 73,533,724 | 41,511,403 |

**2011 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | *2011* | *2010* |
|---|---|---|
| | *රු.* | *රු.* |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය | | |
| වසර සඳහා හිඟය/අතිරික්තය | 73,533,724 | 41,511,402 |
| *ගැළපුම් :* | | |
| ක්ෂය- | 25,380,877 | 24,553,435 |
| පාරිතෝෂික සඳහා වෙන් කිරීම් | 3,233,192 | 2,901,523 |
| ක්ෂය සඳහා අධි වෙන් කිරීම් | (67,655) | - |
| විලම්බිත ආදායම් | (23,974,726) | (22,883,071) |
| පෙර ලැබුණ ප්‍රදාන වලින් මාරු කිරීම් | (5,245,357) | (63,331,585) |

| | 2011 රු. | 2010 රු. |
|---|---|---|
| දේපල, පිරියත හා උපකරණ විකුණුම් ලාභය | (1,283,000) | (114,460) |
| විනිමය ප්‍රතිලාභ | (784,747) | 1,054,488 |
| කාරක ප්‍රාග්ධනය වෙනස්වීමට පෙර මෙහෙයුම් අතිරික්තය | 70,792,308 | (16,308,268) |
| කාරක ප්‍රාග්ධනය වෙනස්වීම් | 8,070,977 | 42,953,011 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් උත්පාදනය වූ ශුද්ධ ලාභය | 78,863,285 | 26,644,744 |
| *ආයෝජන ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහ :* | | |
| දේපළ, පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම් | (28,430,366) | (33,523,733) |
| දේපළ, පිරියත හා උපකරණ විකුණුම් උත්පාදන | 1,283,000 | 120,010 |
| දේපළ, පිරියත හා උපකරණ පුනරුත්ථාපනය හා නඩත්තුව | (561,288) | (9,447,495) |
| | 51,154,631 | (16,206,474) |
| *මූල්‍ය ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහ :* | | |
| ලද ප්‍රාග්ධන ප්‍රදාන | 18,205,340 | 83,420,743 |
| ලද ව්‍යාපෘති ප්‍රදාන | 6,202,608 | |
| සම්පූර්ණ කළ ව්‍යාපෘති ශේෂයන් පැවරුම | (5,805,939) | |
| NELCව්‍යාපෘති පැවරුම | (379,400) | |
| ගෙවූ පාරිතෝෂික | (73,688) | (87,720) |
| සීමාකළ අරමුදල්වල ලැබීම් | 12,093,420 | 12,535,300 |
| මුදල් හා මුදල් සමාන දෑ හි ශුද්ධ වැඩිවීම/අඩුවීම | 81,396,972 | 79,661,849 |
| විනිමය ප්‍රතිලාභ/(අලාභ) | 784,747 | (1,054,488) |
| වසර ආරම්භයේදී මුදල් හා මුදල් සමාන දෑ | 399,327,677 | 320,720,316 |
| වසර අවසානයේදී මුදල් හා මුදල් සමාන දෑ | 481,509,395 | 399,327,677 |

**මූල්‍ය ඉස්මතු කිරීම්**

රු. '000

| *මූල්‍ය වර්ෂය* | 2011 | 2010 | 2009 | 2008 | 2007 | 2006 |
|---|---|---|---|---|---|---|
| *ශේෂ පත්‍රය :* | | | | | | |
| මුදල් හා මුදල් සමාන දෑ | 481,510 | 401,220 | 327,808 | 260,935 | 201,245 | 164,656 |
| ලැබිය යුතු හා ගෙවිය යුතු | 33,202 | 35,580 | 34,859 | 32,253 | 19,219 | 13,058 |
| තොග | 2,588 | 3,251 | 2,404 | 2,126 | 1,548 | 1,859 |
| UCSC මගින් කළමනාකරණය වන SIDA අරමුදල් | 60,429 | 222,763 | 186,424 | 77,020 | 81,555 | 86,432 |
| UCSC මගින් කළමනාකරණය වන LEARN අරමුදල් | - | 51,256 | 74,896 | 49,024 | 61,861 | 27,695 |
| ප්‍රාග්ධන වත්කම් වල පුනරුත්ථාපනය සහ වැඩි දියුණු කිරීම් | 31,309 | 34,381 | 21,694 | 20,455 | 18,918 | 16,231 |
| නොනිමි ඉදිකිරීම් වැඩ | 15,420 | - | - | - | - | - |
| දේපළ පිරියත හා උපකරණ | 83,016 | 81,261 | 75,535 | 83,684 | 88,079 | 115,581 |
| මුළු වත්කම් | 707,474 | 829,712 | 723,620 | 525,497 | 472,425 | 425,512 |
| ප්‍රාග්ධනය | 108,440 | 105,296 | 108,690 | 109,010 | 102,707 | 124,218 |
| සංචිත | 342,299 | 272,126 | 232,899 | 179,578 | 138,765 | 109,647 |
| සීමාකළ අරමුදල් | 54,954 | 43,215 | 30,110 | 22,528 | 19,597 | 18,457 |
| වෙනත් වගකීම් | 201,781 | 409,075 | 351,921 | 214,381 | 211,356 | 173,190 |
| මුළු වගකීම් හා අරමුදල් | 707,474 | 829,712 | 723,620 | 525,497 | 472,425 | 425,512 |
| රාජ්‍ය ප්‍රදාන - පුනරාවර්තන | 83,102 | 65,381 | 68,610 | 71,555 | 78,695 | 52,850 |
| රාජ්‍ය ප්‍රදාන - ප්‍රාග්ධන | 16,000 | 4,920 | 4,167 | 11,055 | 10,560 | 36,740 |
| ලද මුළු රාජ්‍ය ප්‍රදාන | 99,102 | 70,301 | 72,777 | 82,610 | 89,255 | 89,590 |
| උපාධි අපේක්ෂක වැඩසටහන සඳහා පුනරාවර්තන වියදම් | 92,310 | 80,120 | 84,461 | 80,083 | 76,564 | 65,617 |
| ප්‍රාග්ධන වියදම් | 28,628 | 21,301 | 8,542 | 12,764 | 12,305 | 29,064 |
| උපාධි අපේක්ෂක පාඨමාලා සඳහා මුළු වියදම් | 120,938 | 101,421 | 93,003 | 92,847 | 88,869 | 94,681 |

*රු. '000*

| *මූල්‍ය වර්ෂය* | *2011* | *2010* | *2009* | *2008* | *2007* | *2006* |
|---|---|---|---|---|---|---|
| උත්පාදනය කළ ආදායමේ දායකත්වය | 21,836 | 31,120 | 20,226 | 10,237 | - | 5,091 |
| උත්පාදනය කළ ආදායමේ දළ දායකත්වය % | 14% | 25% | 17% | 10% | 0% | 9% |
| උත්පාදනය කළ ආදායමේ ශුද්ධ දායකත්වය % | 28% | 62% | 35% | 18% | 0% | 21% |
| උත්පාදනය කළ ආදායම | 159,429 | 123,267 | 115,690 | 105,426 | 68,494 | 58,981 |
| ව්‍යාප්ත වැඩසටහන් සඳහා පුනරාවර්තන වියදම් | 80,197 | 73,313 | 58,399 | 47,316 | 40,117 | 35,141 |
| විදේශ අරමුදල් සැපයූ ව්‍යාපෘති සඳහා ලද ප්‍රදාන | 6,202 | 93,581 | 104,834 | 70,969 | 35,700 | 46,356 |
| අභ්‍යන්තර ශිෂ්‍යයන් සංඛ්‍යාව | 737 | 739 | 748 | 754 | 584 | 592 |
| සේවකයින් සංඛ්‍යාව | 144 | 151 | 162 | 156 | 147 | 139 |
| ශිෂ්‍යයන් සඳහා වියදම වර්ෂයකට ('000) | 125 | 108 | 113 | 106 | 131 | 111 |
| සේවකයින් සඳහා වියදම වර්ෂයකට ('000) | 578 | 457 | 414 | 384 | 372 | 359 |

අධ්‍යක්ෂ,
කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයන ආයතනය

***කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයන ආයතනයේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(2) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13(7) (ඒ) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව***

කොළඹ විශ්ව විද්‍යාලයට අනුබද්ධිත කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයන ආයතනයේ 2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 108(2) වගන්තිය යටතේ පනවා ඇති 2002 අංක 1 දරන කොළඹ විශ්වවිද්‍යාලීයය පරිගණක අධ්‍යයන ආයතන නියමාවලියේ 23 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනෙත් 13(7) (ඒ) වගන්තිය ප්‍රකාර කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයන ආයතනයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිණිස අවශ්‍යයයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම් වේ.

**1.3 විගණනකගේ වගකීම**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම් වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. අචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශ ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරුකිරීම ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්මේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ තත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්වාගනණය කළ විගණන මත සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්වාගණනය කරනු ලැබේ.

2. **මූල්‍ය ප්‍රකාශන**

2.1 **තත්වාගනණය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයන ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

සමාලෝචිත වර්ෂයේ කොළඹ විශ්ව විද්‍යාලයට අනුබද්ධිත කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයන ආයතනයේ මූල්‍ය ප්‍රකාශන 2012 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. ගිණුම් විගණනය කිරීමෙන් පසුව 2012 ජුනි 06 දින කෙටුම්පත් වාර්තාව නිකුත් කරන ලදී. කෙටුම්පත් වාර්තාවේ රු. 49,129,601 ක ගිණුම්කරණ අඩුපාඩු පෙන්වා දුන් අතර එම ගිණුම්කරණ අඩුපාඩු සියල්ල නිවැරදිකර සංශෝධිත මූල්‍ය ප්‍රකාශන 2012 ජුනි මස 06 දින ඉදිරිපත් කරන ලදී. තෝරා ගන්නා ලද නියැදියෙන් බාහිරව තවදුරටත් මෙවැනි අඩුපාඩු තිබීම විගණනයේ දී බැහැර කළ නොහැක.

2.2.1 **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 18(14) පරිච්ඡේදය අනුව සම්පූර්ණයෙන් ක්ෂය වී ඇති වත්කම්වල ප්‍රයෝජනවත් ජීවිත කාලය දීර්ඝවීමක් පවතීනම් එය වත්කම් ප්‍රත්‍යාගණන කළ යුතු වුවත් සම්පූර්ණයෙන් ක්ෂයවී තිබූ පිරිවැය රු. 2,775,000 ක් වූ වෑන් රථය එසේ ප්‍රත්‍යාගනනය කර නොතිබුණි.

2.2.2 **නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල අනුකූල නොවීම**

| *නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව* | *අනුකූල නොවීම* |
|---|---|
| (අ) මුදල් රෙගුලාසි 756 | සමාලෝචිත වර්ෂයේ ආයතනයේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් ගිණුම් අනුව පිරිවැය වටිනාකම රු. 413,404,222 ක් වූ ස්ථාවර වත්කම් සත්‍යාපනය කර නොතිබුණි. |
| (ආ) මුදල් රෙගුලාසි 371 | සමාලෝචිත වර්ෂය අවසානයේ ආයතනයේ නිලධාරීන් විසින් ලබාගෙන තිබූ කල් ඉකුත් වූ වසර 5 ඉක්මවා තිබූ රු. 289,046 ක් ආපදා ණය සහ රු. 5,900 ක් වූ උත්සව අත්තිකාරම් සමාලෝචිත වර්ෂය අවසානය වන විටද අයකර ගැනීමට අපොහොසත්ව තිබුණි. |
| (ඇ) 2008 දෙසැම්බර් 31 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 142 හා 2009 පෙබරවාරි 05 දිනැති විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 2/2009 | 2009 ජනවාරි 01 දිනෙන් පසුව ලබාදෙන ආපදා ණය උපරිම සීමාව රු. 250,000 විය යුතු වුවත් නිලධාරීන් 08 දෙනෙකුට එය සීමාව ඉක්මවා රු. 763,200 ක් ගෙවා තිබුණි. |
| (ඈ) 1994 ජුනි 14 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 95 | වැටුපට අමතරව වෙනත් දීමනා ලබා ගැනීමේදී ආයතන අධ්‍යක්ෂවරයාගේ අනුමැතිය ලබාගත යුතු වුවද, එවැනි අනුමැතියකින් තොරව නිලධාරීන් 03 දෙනෙකු සඳහා ව්‍යාපෘති මූල්‍ය හා පරිපලාන දීමනා ලෙස රු. 119,500ක් ගෙවා තිබුණි. |

2.2.3 **ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 29/98, 29/98 (i) 07/2007 (i) හා 02/2009 ට පටහැනිව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද ආයතන චක්‍රලේඛ ලිපි අංක 6/2003 ප්‍රකාරව දෙවන හා තෙවන භාෂා ප්‍රවීනතාවය වෙනුවෙන් 2011 වර්ෂයේ දී රු. 69,111 ක් ගෙවා තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ වැඩ කටයුතුවල ප්‍රතිඵලය, පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පෙර රු. 9,569,004 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ දී ඌනතාවය රු. 23,870,170 ක් විය. පුනරාවර්තන වියදම් සඳහා රු. 83,102,728 ක් වූ රජයේ ප්‍රදානය හේතුවෙන් සමාලෝචිත

වර්ෂයේ ඌනතාවය රු. 73,533,724 ක අතිරික්තයක් බවට පත්ව තිබූ අතර ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා රු. 65,381,575 ක් වූ රජයේ ප්‍රදානය හේතුවෙන් එම වර්ෂයේ ඌනතාවය රු. 41,511,405 ක අතිරික්තයක් බවට පත් වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ රු. 32,022,319 ක වර්ධයනයක් ඇතිවීම සඳහා පුනරාවර්තන වියදම් සඳහා වූ රජයේ ප්‍රදාන රු. 17,721,153 කින් වැඩිවීම විශේෂයෙන් බලපා තිබුණි.

4. **මෙහෙයුම් සමාලෝචනය**

අරමුදල් ඌණ උපයෝජනය

උපාධිධාරී වැඩසටහනෙහි වැය නොකළ තොරතුරු තාක්ෂණ (IT Grant Unspent) ප්‍රදාන වටිනාකම රු. 8,95,466 ක් වූ අතර එම මුදල වසර තුනකට වැඩි කාලයක් තිස්සේ අවලව පැවතුණි.

5. **ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

5.1 **වාර්ෂික වාර්තා සභාගත කිරීම**

2008 සහ 2009 වාර්ෂික වාර්ථා 2011 සැප්තැම්බර් 16 වැනි දිනැතිව ප්‍රමාද වී පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට භාර දී තිබුණි. 2010 වර්ෂයේ වාර්ෂික වාර්ථා 2012 මාර්තු 08 දින අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර තිබුණි. රාජ්‍ය ව්‍යවසාය සඳහා මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.5.1 ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමග ආයතනයේ කෙටුම්පත් වාර්ෂික වාර්තාවේ පිටපතක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

6. **පද්ධති හා පාලන**

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතාවයන් වරින්වර ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයක් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළයුතු වේ.

(අ) අත්තිකාරම්,
(ආ) ගිණුම් තැබීම,
(ඇ) අරමුදල් උපයෝජනය.

එච්. ඒ. එස්. සමරවීර,
විගණකාධිපති.

*කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය*

*2011 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන හා සම්බන්ධ විගණකාධිපති වාර්තාව සමග බැඳෙන අපගේ පිළිතුරු ප්‍රකාශය*

2.2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

මෙහි සඳහන් ගිණුම්කරණ අඩුපාඩුවල වටිනාකමට විගණකවරුන් විසින් නිසි පරිදි තුලනය කර නොගන්නා ලද ගිණුම් ශේෂ ද ඇතුළත් වූ අතර ඒවා ඔවුන්ට පෙන්වා දෙන ලදී.

2.2.1 **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති**

ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත අංක 18 ට අනුව එක් එක් වත්කම නැවත ප්‍රත්‍යාගණනය කිරීමක් කළ යුතු බවට සඳහන් නොකරන ලද අතර එම වත්කම් වර්ගයට අයත් සියලු වත්කම් (Entire class of Asst) ප්‍රත්‍යාගණනය කළ යුතු බවට දන්වයි. කෙසේ වෙතත් වත්කම් ප්‍රත්‍යාගණනය තුළින් සංචිත ප්‍රමාණයේ ඉහත යාමක් පමණක් සිදුවන අතර, දැරීමට සිදුවන වියදම් හා බැලීමේ දී එතරම් වාසිදායක තත්ත්වයක් ආයතනයට ඇති නොවේ.

2.2.2 **නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

(අ) මු. රෙ. 756 ට අනුව 2011 වර්ෂයේ දී ස්ථාවර වත්කම් සත්‍යාපනයක් කරන ලද අතර එය නිසි පරිදි සම්පූර්ණ නොකරන ලදී. එහෙත් 2012 වර්ෂයේ දී ආරම්භ කරන ලද සත්‍යාපනය දැනට නිසි පරිදි සිදුවෙමින් පවතී.

(ආ) විදේශගත වී ඇති කථිකාචාර්ය මණ්ඩලයේ නිලධාරීන් නැවත සේවයට වාර්තා නොකරන ලද හෙයින් මෙකී ණය අය කර ගැනීමට නොහැකි වී ඇත. කෙසේ වෙතත් ඔවුන්ගේ වි. වි. සේ. අ. අ. අයකර ගැනීමට කටයුතු යොදමින් සිටී.

(ඇ) විශ්ව විද්‍යාල පද්ධතිය තුළ ඇති සේ අ. අ. ණය ක්‍රමය හැරුණු විට ඇති එකම ණය යෝජනා ක්‍රමය වන්නේ ආපදා ණය ක්‍රමය පමණි. චක්‍රලේඛයට අනුව රජයේ අරමුදල්වලින් රු. 250,000 පමණක් ලබා දෙන අතර, අභ්‍යන්තර ඉපයීම්වලින්

ඉතිරි ප්‍රමාණය ලබා දේ. මෙකී ණය ඉල්ලීම්වලට රජයේ ප්‍රතිපාදනයට අමතරව අභ්‍යන්තරිකව උපයන ලද මුදල්වලින් ප්‍රතිපාදන ලබා ගැනීමට කළමනාකරණ මණ්ඩලයට ඉල්ලීමක් කරනු ලැබූ අවස්ථාවේ එහි නිගමනය වූයේ ආයතනයේ පවතින මෙහෙයුම් ක්‍රියාවලිය සලකා බලන විට මෙම ක්ෂේත්‍රයේ නිපුණතා ඇති අය තවදුරටත් ආයතනය වෙත රඳවා ගැනීමේ අභිප්‍රේරණ ක්‍රමයක් ලෙස (Motivation) මෙම සම්පූර්ණ ණය මුදලම ලබා දියයුතු බවයි.

(ඈ) ආයතනය විසින් විදේශ අරමුදලින් ක්‍රියාත්මක වන විදේශ ව්‍යාපෘති ගණනාවක් පවත්වා ගෙන යනු ලබන අතර ඒවායේ ගිණුම්මය හා පරිපාලන කටයුතු ස්ථිර සේවයේ නියුතු නිලධාරීන් ලවා ඉටු කරවා ගනී. ඒ වෙනුවෙන් ඉතාමක් වාසිදායක පදනම මත ඔවුන්ට මාසිකව දීමනාවක් ගෙවනු ලැබේ. පිටතින් සේවකයින් බඳවා ගෙන මෙම කාර්යය ඉටු කරවා ගැනීමට සිදු වුවහොත් ඒ සඳහා මෙයට වඩා විශාල වියදමක් දැරීමට සිදු වේ. මේ ගැන ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන ඇත.

2.2.3 **ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

තෙවන හා දෙවන භාෂා ප්‍රවීණත්වය වෙනුවෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ආයතන ලිපි 6/2003 ප්‍රකාරව මෙම දීමනාව ගෙවන ලදී.

4. **අරමුදල් ඌණ උපයෝජනය**

තොරතුරු තාක්ෂණ ප්‍රදාන යටතේ ලද මුදලින් මේ දක්වා වියදම් නොකල ප්‍රමාණය 2012 වර්ෂයේ දී වියදම් කිරීමට කටයුතු යොදවමින් සිටී.

5. **වාර්ෂික වාර්තාව සභාගත කිරිම**

වාර්ෂික වාර්තාව ඇතුළත් විය යුතු ප්‍රධාන අංගයක් වන්නේ විගණන මූල්‍ය ප්‍රකාශන (Audited Financial Statement) හා විගණන වාර්තාවයි. මෙකී මූලික අවශ්‍යතාවයන් දෙක සම්පූර්ණ නොවන හෙයින් අවසාන ගිණුම් සමග වාර්ෂික වාර්තාව විගණනයට ඉදිරිපත් කිරීමට නොහැකි විය.

කෙසේ වෙතත් කෙටුම්පත් වාර්ෂික වාර්තාවේ පිටපතක් 2012.07.13 දින විගණනයට ඉදිරිපත් කරන ලදී.

6. **පද්ධති හා පාලන**

මෙහි සඳහන් කර ඇති අංශ කෙරේ අවධානය යොමු කිරීමට කටයුතු කරමි.

මහාචාර්ය ගිහාන් වික්‍රමනායක,
අධ්‍යක්ෂ.

08-377

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි (ලියාපදිංචි අංකය පී.කිව් 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව.

ණය ගිණුම් අංක : 509086.
ග්ලෝබල් එයාර්ස්පෙයාර්ස් අයිඑන්සි.

2011 ජූලි මස 29 වැනි දින පවත්වන ලද රැස්වීමක දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් මෙලෙස නිශ්චය කරන ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. එම්. පී. එස්. ජයවීර විසින් 2006 ජූලි 06 වැනි දින සහතික කරන ලද අංක 944 දරන දැන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. ලෙස හඳුන්වනු ලබන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි නමට ලියන ලද්දා වූ බැඳුම්කර යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ඇමෙරිකා එක්සත් ජනපදය තුළ නීත්‍යානුකූල ස්ථාපිත සමාගමක් වන මියාමි FL33176 හි 111 ටෙරසයේ 9749 SWදරන තැන ලියාපදිංචි කාර්යාලය පිහිටි ග්ලෝබල් එයාර්ස්පෙයාර්ස් අයිඑන්සී ණයකරු හැටියට ද හරිජ සිවකුමාර් සින්නරාජා උකස්කරු හැටියට ද පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ ඇමෙරිකානු ඩොලර් දෙලක්ෂ පනස් හත්දහස් අටසිය තිස් පහයි ශත අනූ දෙකක (ඇ. ඩො. 2,57,835.92) මුදලක් 2011 මැයි 3 දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී ඇමෙරිකානු ඩොලර් දශලක්ෂ පනස් හත්දාහස් අටසිය තිස් පහයි ශත අනූ දෙකක (ඇ. ඩො. 2,57,835.92) මුදල අයකර ගැනීම සඳහා සහ 2011 මැයි 04 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට ඇ. ඩො. 2,50,511.96 ක මුදල මත 4% ක වැඩිපුර වාර්ෂික පොලිය සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුළුව මෙතෙක් ලබාගෙන ඇත්තා වූ යම් ගෙවීම් වෙතොත් ඒවා ද අඩුකොට එකී අංක 944 දරන බැඳුම්කර මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට උකස් කොට ඇත්තා වූ ද මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ දේපල සහ පරිශ්‍ර

කොළඹ 12 හල්ස්ඩෝෆ් වීදියේ අංක 99 දරන ස්ථානයේ පිහිටි ත්‍රිවංක සහ සේනානායක වෙන්දේසිකරුවන් හි අනුඥාලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

### උපලේඛනය

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ සහ මහ නගර සභා සීමාවේ සල්පිටි කෝරළේ පල්ලේපත්තුවේ කොට්ඨාස අංක 36 දරන කුරුඳුවත්ත බාන්ස් පෙදෙසේ වරිපනම් අංක 75/3 නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු වී. සිවසබේසන් විසින් 1988 නොවැම්බර් 23 වැනි දින මැන සාදන ලද අංක 1024 A දරන පිඹුරේ ලොට් A වශයෙන් දැක්වෙන ඉඩමට මායිම් වශයෙන් උතුරට පිඹුරු අංක 1024A ලොට් Bද, නැගෙනහිරට එම පිඹුරු අංක 1024 A හි ලොට් 3 ද, දකුණට බලයලත් මිනින්දෝරු එස්. එම්. ජලලුදීන් 1988 සැප්තැම්බර් 01 දින සාදන ලද පිඹුරේ ලොට් 1 සහ බස්නාහිරට බාන්ස් පෙදෙසේ වරිපනම් අංක 71/9, 71/8 සහ 71/6 මායිම් වූ එකී අංක 1024A දරන පිඹුර ප්‍රකාරව පර්චස් දොළහයි දශම පහ (අ. 0, රූ. 0, පර්. 12.5) ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි අනෙකුත් සියලුම දේත් සමග වන මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ඒ 759/224 වෙළුම/පත්‍රිරුව යටතේ ලියාපදිංචි කර ඇත.

පහත සඳහන් ඉඩම් කැබැල්ල මතුපිටින් වූ ප්‍රවේශ අයිතිය සමග බාන්ස් පෙදෙසේ පිහිටි බෙදාවෙන්කොට සාදන ලද පිඹුරු අංක 1024A හි ලොට් 3 වශයෙන් දැක්වෙන (පාරක් සඳහා වූ වෙන් කිරීමක්) කොටසට මායිම් වශයෙන් උතුරට බාන්ස් පෙදෙසේ වරිපනම් අංක 75/5 ද, නැගෙනහිරට බාන්ස් පෙදෙසේ වරිපනම් අංක 77/1B ද, දකුණට පාර සහ බස්නාහිරට මතු සඳහන් පිඹුරු අංක 1014 හි ලොට් 1 සහ මතු සඳහන් පිඹුරු අංක 1024A හි දැක්වෙන ලොට් A සහ B පිඹුරු අංක 1024A අනුව පිඹුරු ප්‍රකාරව පර්චස් අටයි දශම හතයි පහ (අ. 0, රූ. 0, පර්. 8.75) ක මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ඒ 779/273 වෙළුම/පත්‍රිරුව යටතේ ලියාපදිංචි කර ඇත.

ආර්. ආර්. දුනුවිල මිය,
සමාගම් ලේකම්.

08-388

---

## යූනියන් බෑන්ක් ඔෆ් කලම්බු පීඑල්සී

### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ යූනියන් බෑන්ක් ඔෆ් කලම්බු පීඑල්සී විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීමයි.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය ප්‍රකාරව යූනියන් බෑන්ක් ඔෆ් කලම්බු පීඑල්සී (මෙහි මින්මතු "යූනියන් බැංකුව" වශයෙන් හඳුන්වනු ලබන,) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2013 මැයි මස 31 වැනි දින පවත්වන ලද රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කටුනායක කුරණ, එස්. එල්. ඒ. එෆ් පාරේ, අංක 321 දරන ස්ථානයේ පිහිටි, ලියාපදිංචි අංක පී. වී. 16235 දරන ඇල්ෆටෙක් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් (මෙහි මින් මතු "උකස්කරු" වශයෙන් හඳුන්වනු ලබන) විසින් යූනියන් බැංකුවෙන් බැංකු පහසුකම් ලබාගෙන ඇති බැවින් ද, ඒ අනුව, උකස්කරු මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් ජී. ඒ. එල්. පී. ධම්මික සිල්වා මහතා විසින් සහතික කරන ලද අංක 1332 සහ 2010.09.06 වැනි දින දරන ප්‍රාථමික උකස් බැඳුම්කරය සහ අංක 1552 සහ 2011.09.02 වැනි දින දරන ද්විතියික උකස් බැඳුම්කරය ලියා අත්සන් කොට ඉහත සඳහන් බැංකු පහසුකම් නිසා යූනියන් බැංකුවට අයවිය යුතු රුපියල් හතරකෝටි විසිතුන්ලක්ෂ හැත්තෑඅටදහස් තුන්සියයක (රුපියල් 42,378,300) මුදල සහ ඒ මත පොලිය ආපසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන් මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළ උකස් කොට ඇපයට තබා ඇති බැවින් ද ඒ අනුව, 2013.04.25 වැනි දිනට රුපියල් දෙකෝටි අසූහත්ලක්ෂ හතළිස් හයදහස් තුන්සිය තිස්අටකුත් ශත හැටපහක (රුපියල් 28,746,338.65) මුදලක් සහ ගෙවීම පැහැර හැරීම නිසා 2013.04.26 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඒ මත උපචිත වාර්ෂික පොලිය ද ඉහත සඳහන් බැංකු පහසුකම් නිසා උකස්කරුගෙන් යූනියන් බැංකුවට ලැබිය යුතු සහ අයවිය යුතුව තිබෙන බැවින් ද,

උකස්කරු ඉහත කී ණය ශේෂය පියවා දැමීම පැහැර හැරීම සිදුකර ඇති බවට සෑහීමකට පත්වීමෙන් අනතුරුව, යූනියන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 3 වන වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ක්‍රියා කරමින්, රුපියල් දෙකෝටි අසූහත්ලක්ෂ හතළිස් හයදහස් තුන්සිය තිස්අටකුත් ශත හැටපහක (රුපියල් 28,746,338.65) මුදල සහ 2013.04.06 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඒ මත ගෙවීම් පැහැර හැරීමේ පොලිය ද, 1990 අංක 04 දරන ඉහත සඳහන් පනතේ 13 වන වගන්තිය යටතේ ඉහත සඳහන් අංක 1332 දරන ප්‍රාථමික උකස් බැඳුම්කරය සහ 1552 දරන ද්විතියික උකස් බැඳුම්කරය ප්‍රකාරව යූනියන් බැංකුවට අයකර ගැනීමට හිමිකම් තිබෙන වෙනත් සියලු ම මුදල් ද අයකර ගැනීම සඳහා, මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් ජී. ඒ. එල්. පී. ධම්මික සිල්වා මහතා විසින් සහතික කරන ලද ඉහත සඳහන් අංක 1332 සහ 2010.09.06 වැනි දින දරන ප්‍රාථමික උකස් බැඳුම්කරය සහ අංක 1552 සහ 2011.09.02 වැනි දින දරන ද්විතියික උකස් බැඳුම්කරය ප්‍රකාරව සහ ඊට යටත්ව යූනියන් බැංකුවට උකසට තබන ලද මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළ, 1990 අංක 04 දරන ඉහත සඳහන් පනත ප්‍රකාරව ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට බලයලත් වෙන්දේසිකරුවන් වන ෂොක්මන් ඇන්ඩ් සමරවික්‍රම වෙත බලය පැවරීමට ඉහත සඳහන් 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ මීගමුව ලියාපදිංචි කොට්ඨාසය තුළ අලුත්කුරු කෝරළේ දාසිය පත්තුවේ කටුනායක - සීදුව මහ නගර සභා සීමාව තුළ කුරණ - කටුනායක පිහිටි බැඹිගහවත්ත නොහොත් මාදන්ගහවත්ත නමැති බෙදාවෙන් කළ ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. ඩී. ජේ. වී. පෙරේරා මහතා විසින් මැන සාදන ලද අංක 5574 සහ 1980.07.12 වැනි දින දරන පිඹුර ප්‍රකාර මායිම් උතුරට කලින් කලුප්පුකන්කානම්ලාගේ දොන් රෝමියානු යන අයට අයිති දැන් ඩී. එස්. මොනිකා යන අයට අයිති දේපළ ද, නැගෙනහිරට කොළඹට දිවෙන ප්‍රධාන මාර්ගය ද, දකුණට කලින් කොළඹගේ සැමුවෙල් සිල්වාට අයිති දැන් බ්‍රියට්‍රිස් ක්ලැටිල්ඩා යන අයට අයිති දේපළ ද, බස්නාහිරට කලින් කලුප්පුකාන්කානම්ලාගේ දොන් ප්‍රේමියනි යන අයට අයිති දැන් ඩී. එස්. මොනිකා යන අයට අයිති දේපළ ද යන මායිම් තුළ පිහිටි, ඉහත කී අංක 5574 දරන පිඹුර අනුව ප්‍රමාණයෙන් රූඩ් එකකුත් පර්චස් හතක් (අ. 0, රූ. 1, පර්. 07) විශාල ඉඩම සහ ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පලතුරු

ආදී සෑම සියලු දේත් සමග ය. මෙය දේපළ මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C917/195 දරන හිමිකම යටතේ ලියාපදිංචි කර ඇත.

මැතක දී සිදුකළ ඉඩම් මැනීම ප්‍රකාරව ඉහත කී ඉඩම පහත සඳහන් පරිදි විස්තර කෙරේ.

ඉහත කී කුරණ - කටුනායක පිහිටි බැඹිගහවත්ත හෙවත් මාදන්ගහවත්ත නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. ඒ. ආර්. පත්මසිරි විසින් මැන සාදන ලද අංක 286 සහ 2003.01.18 දින පිඹුරේ කැබලි අංක A දරන බෙදා වෙන්කළ ඉඩම් කොටසට ඉහත සඳහන් අංක 286 දරන පිඹුර ප්‍රකාර මායිම් උතුරට : කලින් කේ. කේ. දොන් රෝමියානු යන අයට අයිති දැන් ඩී. එස්. මොනිකා යන අයට අයිති ඉඩම ද, නැගෙනහිරට : උඩ පාර ද, දකුණට : කලින් සී. එස්. සිල්වා යන අයට අයිති දැන් බ්‍රියට්‍රිස් ක්ලැටිල්ඩා යන අයට අයිති ඉඩම ද, බස්නාහිරට : කලින් කේ. කේ. දොන් රෝමියානු යන අයට අයිති දැන් ඩී. එස්. මොනිකා යන අයට අයිති ඉඩම ද යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකකුත් පර්චස් දෙකයි දශම පහයි බින්දුවක් (අ. 0, රූ. 01, පර්. 2.50) හෙවත් හෙක්ටයාර් 0.1630 ක් විශාල බිම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදී සෑම සියලු දේත් සමග ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

එස්. ඩී. එන්. එස්. කන්නන්ගර,
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

08-382

---

පීවී 60483.

## 2007 අංක 07 දරන සමාගම් පනත

### 394(3) වගන්තිය යටතේ "ලංකා ඊබිස්නස් ඩිරෙක්ටරි (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනත විධිවිධාන යටතේ "2007.06.29" දින සංස්ථාපිත සමාගමක් වන "ලංකා ඊබිස්නස් ඩිරෙක්ටරි (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, "ලංකා ඊබිස්නස් ඩිරෙක්ටරි (ප්‍රයිවට්) ලිමිටඩ්" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් (රාජකාරි ඉටුකිරීම) දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්,
(රාජකාරි ඉටුකිරීම).

2013 ජූලි මස 19 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

08-396

---

පීවී 60395.

## 2007 අංක 07 දරන සමාගම් පනත

### 394(3) වගන්තිය යටතේ "මහා ෂිපිං (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනත විධිවිධාන යටතේ "2007.06.26" දින සංස්ථාපිත සමාගමක් වන "මහා ෂිපිං (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, "මහා ෂිපිං (ප්‍රයිවට්) ලිමිටඩ්" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් (රාජකාරි ඉටුකිරීම) දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්,
(රාජකාරි ඉටුකිරීම).

2013 ජූලි මස 19 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

08-395

---

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැනුම් දීම

2013.07.04 වෙනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් එස්. ඩී. පී. ආර්. ගුණවර්ධන විසින් සහතික කරන ලද 2012.12.04 දිනැති අංක 560 දරන උකස් බැඳුම්කරය මත මුල් මුදල හා 2012.12.07 දින තෙක් පොලිය වශයෙන් රුපියල් දෙකෝටි හැට හතර ලක්ෂ තිස් දෙදහස් එකසිය අනූ එකයි ශත විසි හතක (රු.26,432,191.27) මුදල සහ රුපියල් දෙකෝටි පනස් ලක්ෂයක (රු.25,000,000) මුදල මත වසරකට සියයට දහ නමයයි දශම පහ (19.5%) බැගින් තවදුරටත් පොලියද 2012.12.04 වෙනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් කොළඹ 11, කෙයිසර් වීදියේ, අංක 224 හි පී. එම්. බී. ට්‍රේඩර්ස් මහත්වරුන්ගෙන් අයවිය යුතුව ඇත.

2. එකී අංක 560 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු එකී රුපියල් දෙකෝටි හැට හතර ලක්ෂ තිස් දෙදහස් එකසිය අනූ එකයි ශත විසි හතක (රු.26,432,191.27) මුදල සමග 2012.12.07 දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අය විය යුතු පොලියද, ලංකා බැංකු ආඥා පනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල්ද අය කර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත

උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොලොන්නාව, විහාර මාවත, අංක 50/3 හි පදිංචි වෙන්දේසිකාර ටී. කරුණාරත්න මහතාට එකී ලංකා බැංකු ආඥා පනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වන වගන්තිය යටතේද, ලංකා බැංකු ආඥාපනතේ 21 වන වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුවේ පිටකොටුව ශාඛාවේ ජ්‍යෙෂ්ඨ කළමනාකරු (අයකර ගැනීම්) හට මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලේ, පල්ලෙපත්තුවේ, කොළඹ මහ නගර සභාවේ පරිපාලන සීමාව තුළ, මට්ටක්කුලිය, කොට්ඨාස අංක 1 හි, ෆ්‍රාන්සෙවත්ත පටුමග දිගට පිහිටි ෆ්‍රාන්සෙවත්ත පටුමගේ වරිපනම් අංක 65 දරන, පර්චස් විසිහතයි දශම අටයි පහක (අ. 0, රූ. 0, පර්. 27.85) බිම් ප්‍රමාණයකින් යුත්, "මීගහවත්ත" නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. ජෙගදීසන් විසින් සාදන ලද 1976 මාර්තු 31 දිනැති අංක 2028 දරන පිඹුරෙහි (බලයලත් මිනින්දෝරු කේ. සෙල්වරත්නම් විසින් මෑතකදී සාදන ලද 2006 ජනවාරි 31 දිනැති අංක 10823 දරන පිඹුරෙහි) ලොට් "C2" ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් $C^2$ උතුරට : වික්‍රම මාවතෙහි වරිපනම් අංක 60/67 දරන පරිශ්‍රයද, නැගෙනහිරට : ෆ්‍රාන්සෙවත්ත පටුමගෙහි වරිපනම් අංක 71 දරන පරිශ්‍රය සහ එකී අංක 2028 දරන පිඹුරෙහි ලොට් C ද, දකුණට : ෆ්‍රාන්සෙවත්ත පටුමග සහ එකී අංක 2028 දරන මිනුම් පිඹුරෙහි ලොට් C ද, බස්නාහිරට : බලයලත් මිනින්දෝරු එස්. ජෙගදීසන් විසින් සාදන ලද 1971.03.18 දිනැති අංක 1823 දරන පිඹුරෙහි නිරූපිත ලොට් B ද, එකී අංක 2028 දරන පිඹුරට අනුව එහි ඇති සියලු දේද සහිතව පර්චස් 30 ක (අ. 0, රූ. 0, පර්. 30) බිම් ප්‍රමාණයකින් යුක්තවන අතර, මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A 1168/68 හි ලියාපදිංචි කර ඇත.

ලොට් $C^2$ ලෙස දක්වා ඇති එකී ඉඩම් කැබැල්ල බලයලත් මිනින්දෝරු කේ. සෙල්වරත්නම් විසින් මෑතකදී සාදන ලද 2006 ජනවාරි මස 31 දිනැති අංක 10823 දරන මිනුම් පිඹුරට අනුව පහත ආකාරයට විස්තර කර ඇත.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලේ, පල්ලෙපත්තුවේ, කොළඹ මහ නගර සභා පරිපාලන සීමාව තුළ, මට්ටක්කුලිය, කොට්ඨාස අංක 1 හි, ෆ්‍රාන්සෙවත්ත පටුමග දිගට පිහිටි ෆ්‍රාන්සෙවත්ත පටුමග, වරිපනම් අංක 65 දරන, "මීගහවත්ත" නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. සෙල්වරත්නම් විසින් සාදන ලද 2006 ජනවාරි 31 දිනැති පිඹුරු අංක 10823 දරන පිඹුරෙහි ලොට් $C^2$ ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපනය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් $C^2$ උතුරට වික්‍රම මාවතෙහි වරිපනම් අංක 60/67 දරන පරිශ්‍රයද, නැගෙනහිරට ෆ්‍රාන්සෙවත්ත පටුමගෙහි වරිපනම් අංක 71 දරන පරිශ්‍රය සහ ෆ්‍රාන්සෙවත්ත පටුමගෙහි වරිපනම් අංක 69 දරන එකී අංක 2028 දරන මිනුම් පිඹුරෙහි ලොට් $C^1$ ද, දකුණට ෆ්‍රාන්සෙවත්ත පටුමගෙහි වරිපනම් අංක 63 දරන එකී අංක 2028 දරන මිනුම් පිඹුරෙහි ලොට් $C^1$ ද, බස්නාහිරට ෆ්‍රාන්සෙවත්ත පටුමගෙහි වරිපනම් අංක 63 දරන පරිශ්‍රයද මායිම්ව එකී අංක 10823 දරන පිඹුරට අනුව පර්චස් විසි හතයි දශම අටයි පහක (අ. 0, රූ. 0, පර්. 27.85) ක බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති සියලු දේද වේ.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඩබ්. එම්. ආර්. එම්. මාරසිංහ,
කළමනාකරු.
ලංකා බැංකුව.

08-314

---

පීවී 60515.

### 2007 අංක 07 දරන සමාගම් පනත

394(3) වගන්තිය යටතේ "ලංකා ගාඩියන් හාඩ්වෙයා (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනත විධිවිධාන යටතේ "2007.07.03" වැනි දින සංස්ථාපිත සමාගමක් වන "ලංකා ගාඩියන් හාඩ්වෙයා (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිතර නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, "ලංකා ගාඩියන් හාඩ්වෙයා (ප්‍රයිවට්) ලිමිටඩ්" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් (රාජකාරි ඉටුකිරීම) දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්,
(රාජකාරි ඉටුකිරීම).

2013 ජූලි මස 19 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

08-397

---

### සම්පත් බැංකුව පීඑල්සී

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

එම්. ආර්. බදුර්දීන්
ගිණුම් අංක : 0029 5001 4655.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2013.06.30 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් වයි. ආර්. එම්. කොස්තා යන අය විසින් ලියා සහතික කරන ලද 2010 අගෝස්තු 16 දාතම හා අංක 871 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසුගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මොහිදීන් රිෆ්කි බදුර්දීන් යන අය බන්ධනදායින් වශයෙන් පැහැර හැර ඇති හෙයින්ද එකී අංක 871 දරන බැඳුම්කරය ප්‍රකාර අයවියයුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකා මුදලින් රුපියල් එක් කෝටි හතලිස් හත් ලක්ෂ අසූ පන් දහස් දෙසිය හැත්තෑ එකයි ශත පනස් නමයක (රු. 14,785,271.59) මුදලක් 2013

මැයි 17 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින්ද, එකී රුපියල් එක් කෝටි හතලිස් හත් ලක්ෂ අසූ පන් දහස් දෙසිය හැත්තෑ එකයි ශත පනස් නමයක (රු. 14,785,271.59) මුදල ද, 2013 මැයි 18 දින සිට අංක 871 දරන එකී බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් එක් කෝටි තිස්හතර ලක්ෂ අසූ පන් දහස් නමසිය හැට දෙකයි ශත විසි නමයක (රු. 13,485,962.29) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ හතරක් (14%) බැගින් වූ පොළියද, දැන්වීම් ගාස්තුද, දරන්නට සිදුවූ වෙනත් වියදම්ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා අංක 871 දරන එකී බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන ෂොක්මන් සහ සමරවික්‍රම ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලිය යුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ දෙහිවල- ගල්කිස්ස මහ නගර සභා සීමාවන් තුළ කළුබෝවිල ජයා මාවත හි පිහිටි (කලින් කළුබෝවිල පන්සල පාර වරිපනම් අංක 59/3) කලුබෝවිල පන්සල පාර වරිපනම් අංක 45 9/B/1 දරන "කොටුවේකුඹුර, කදුරුගහවත්ත, කදුරුගහකුඹුර, පට්ටියේවත්ත, කොළඉන්නේවත්ත, මීගහවත්ත, පාවුලාඕවිට, මීගහවත්ත, මාදංගහවත්ත සහ මාදංගහකුඹුර" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩී. ජේ. ද සිල්වා යන අය විසින් සාදන ලද (1992 නොවැම්බර් මස 16 වැනි දින සත්‍ය පිටපතක් වශයෙන් සහතික කළ) 1986 මැයි 28 දාතම හා අංක 2018 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 3A1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : අංක 929 දරන පිඹුරේ ලොට් 6 සහ ලොට් 3A2, නැගෙනහිරට : අංක 586 දරන පිඹුරේ ලොට් 4, ලොට් 5B සහ 3A2 සහ අංක 586 දරන පිඹුරේ ලොට් 6, දකුණට : අංක 929 දරන පිඹුරේ ලොට් 3B සහ ලොට් 3A2 සහ බස්නාහිරට : අඩි 10 පළල පාර (අංක 929 දරන පිඹුරේ ලොට් 11) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහ අටයි දශම නමයයි එකක් (අ.0, රූ.0, පර්.18.91) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සහ සියළුම මාර්ග අයිතින් ද, වෙනත් අයිතින් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන්. පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබන්ධයන් ද සමග එකී අංක 2018 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව M3332/30 යටතේ දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

පහත සඳහන් දෑ දිගේ හා ඒ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතියද සමගය.

බලයලත් මානක තැන එස්. ජෙගතීසන් යන අය විසින් සාදන ලද 1974 නොවැම්බර් 24 දාතම හා අංක 1965 දරන පිඹුරේ නිරූපිත ලොට් 11 සහ දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව M1711/248 යටතේ ලියාපදිංචි කොට ඇත.

අංක 2018 දරන එකී පිඹුරේ නිරූපිත ලොට් 5B දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව M1525/82 යටතේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

08-435

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.